# සියල්ල හටගෙන නිරෝධ වෙයි
# මෙසේ දැකීමෙන් අවිද්‍යාව ප්‍රහාණය වෙයි
## අවිජ්ජාප්‍රහාණ සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 4 - පිටු අංක 68 - 69)

- ඇස අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  රූප අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  චක්ඛු විඥානය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  චක්ඛු ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  චක්ඛු ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූ හෝ නො දුක්නොසැප වූ යම් වේදනාවක් උපදී නම් එය ද, අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

- කන අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ශබ්ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  සෝත විඥානය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  සෝත ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  සෝත ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සැප වූ යම් වේදනාවක් උපදී නම්, එය ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

- නාසය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ගන්ධ අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ඝාණ විඥානය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ඝාණ ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ඝාණ ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සැප වූ යම් වේදනාවක් උපදී නම්, එය ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

- දිව අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  රස අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ජිව්හා විඥානය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ජිව්හා ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  ජිව්හා ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූහෝ නො දුක් නො සැප වූ යම් වේදනාවක් උපදී නම්, එය ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

- කය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

  පහස අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

කාය විඤ්ඤාණය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

කාය ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

කාය ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සැප වූ යම් වේදනාවක් උපදී නම්, එය ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

- සිත අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

සිතුවිලි අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

මනෝ විඤ්ඤාණය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

මනෝ ස්පර්ශය අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.

මනෝ ස්පර්ශය නිසා සැප වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සැප වූ යම් වේදනාවක් උපදී නම්, එය ද අනිත්‍ය ලෙස දන්නා දක්නා තැනැත්තාගේ අවිද්‍යාව ප්‍රහාණය වෙයි. විද්‍යාව උපදියි.